# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## සේවා යෝජකයන් වෙත කෙරෙන දැනුම් දීමයි.
## උපයන විට ගෙවීම් බදු චක්‍ර - 2011/2012 තක්සේරු වර්ෂය

සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමිකයෙන් 2011.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාසිකව බදු අඩු කිරීම් පිණිස වූ බදු චක්‍ර සාරාංශගත ආකෘති මගින් පහත දක්වා ඇත.

මුද්‍රිත විස්තරාත්මක " උ.වි.ගෙ. බදු චක්‍ර" සියළු ලියාපදිංචි සේවා යෝජකයන් වෙත ඉදිරියේදී ලැබීමට සලස්වනු ඇත.

## බදු චක්‍ර 1

**නිත්‍ය ලාභවලින් මාසික බදු අඩු කිරීම**

**(ශ්‍රී ලංකාවේ වාසික සහ පුරවැසියන් වන සියළුම සේවා නියුක්තිකයින්)**

| | මාසික පාරිශ්‍රමිකය | | බද්ද |
|---|---|---|---|
| 1. | මාසික පාරිශ්‍රමිකය රු. 50,000 දක්වා | - | නිදහස් |
| 2. | මාසික පාරිශ්‍රමිකය රු.50,000 වැඩි නමුත් රු. 91,667 වැඩි නොවන විට | - | මාසික පාරිශ්‍රමිකයෙන් 4% කින් රු. 2,000 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 3. | මාසික පාරිශ්‍රමිකය රු.91,667 වැඩි නමුත් රු. 133,333 වැඩි නොවන විට | - | මාසික පාරිශ්‍රමිකයෙන් 8% කින් රු. 5,667 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 4. | මාසික පාරිශ්‍රමිකය රු.133,333 වැඩි නමුත් රු. 175,000 වැඩි නොවන විට | - | මාසික පාරිශ්‍රමිකයෙන් 12% කින් රු.11,000 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 5. | මාසික පාරිශ්‍රමිකය රු.175,000 වැඩි නමුත් රු. 216,667 වැඩි නොවන විට | - | මාසික පාරිශ්‍රමිකයෙන් 16% කින් රු.18,000 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 6. | මාසික පාරිශ්‍රමිකය රු.216,667 වැඩි නමුත් රු. 300,000 වැඩි නොවන විට | - | මාසික පාරිශ්‍රමිකයෙන් 20% කින් රු.26,667 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 7. | මාසික පාරිශ්‍රමිකය රු. 300,000 වැඩි | - | මාසික පාරිශ්‍රමිකයෙන් 24% කින් රු.38,667 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන්ද ඔවුන් දේශීය ආදායම් පනතේ විධි විධාන අනුව ශ්‍රී ලංකාවේ වාසික වන්නේ නම් බදු අඩු කර ගැනීම සඳහා බදු චක්‍ර 1 අදාල කර ගත යුතුය.

## බදු චක්‍ර 4

### ශ්‍රී ලංකාවේ පුරවැසි නොවන නිර්වාසික සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කිරීම

ශ්‍රී ලංකාවේ පුරවැසි නොවන නිර්වාසික සේවා නියුක්තිකයන්ගෙන් බදු අඩු කර ගැනීම සඳහා පහත සඳහන් බදු චක්‍රය යොදා ගත යුතුය.

| | මාසික පාරිශ්‍රමිකය | බද්ද |
|---|---|---|
| 1. | රු. 8,333 වැඩි නොවන විට | - නිදහස් |
| 2. | රු. 8,333 වැඩි නමුත් රු.50,000 වැඩි නොවන විට | - මාසික පාරිශ්‍රමිකයෙන් 4% කින් රු.333 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 3. | රු.50,000 වැඩි නමුත් රු.91,667 වැඩි නොවන විට | - මාසික පාරිශ්‍රමිකයෙන් 8% කින් රු.2,333 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 4. | රු.91,667 වැඩි නමුත් රු.133,333 වැඩි නොවන විට | - මාසික පාරිශ්‍රමිකයෙන් 12% කින් රු.6,000 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 5. | රු.133,333 වැඩි නමුත් රු.175,000 වැඩි නොවන විට | - මාසික පාරිශ්‍රමිකයෙන් 16% කින් රු.11,333 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 6. | රු.175,000 වැඩි නමුත් රු.258,334 වැඩි නොවන විට | - මාසික පාරිශ්‍රමිකයෙන් 20% කින් රු.18,333 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |
| 7. | රු.258,334 වැඩි | - මාසික පාරිශ්‍රමිකයෙන් 24% කින් රු.28,666 ක් අඩු කිරීමෙන් පසු ශේෂය |

## බදු චක්‍ර 6

### බදු මත බදු අනුප්‍රමාණ

1. පහත සඳහන් අවස්ථාවන්හිදී බදු මත බදු උද්ගත වේ.

   (i) යම් සේවා නියුක්තිකයකුගේ ආදායම් බද්ද ඔහුගේ වැටුපෙන් අඩු නොකර, සේවා යෝජක හෝ වෙනත් තැනැත්තෙකු විසින් ගෙවන විට,

   (ii) යම් සේවා නියුක්තිකයකුගේ ආදායම් බද්ද ඔහුගේ වැටුපෙන් අඩු කර ගෙවා නැවත ප්‍රතිපූර්ණය කරන විට,

**බදු මත බදු අනුප්‍රමාණ**
**(වාසික වන සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන්)**

| මාසික බද්ද (රුපියල්) | බදු මත බදු අනුප්‍රමාණය |
|---|---|
| 01 - 1,600 | 4.2% |
| 1,601 - 4,600 | 8.7% |
| 4,601 - 8,800 | 13.6% |
| 8,801 - 14,000 | 19.0% |
| 14,001 - 26,667 | 25.0% |
| 26,667 ට වැඩි | 31.6% |

## බදු චක්‍ර 7

වැටුප් ලේඛනයට ඇතුලත් කර නොමැති සමාගමක සභාපතිවරයකුට හෝ අධ්‍යක්ෂවරයකුට හෝ විධායක නොවන අධ්‍යක්ෂවරයකුට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන්, හෝ සේවා යෝජකයන් එක් අයෙකුට වඩා වැඩි දෙනෙකු විසින් සේවයේ යොදවා ඇති විටෙක එවැනි පුද්ගලයෙකුගේ පාරිශ්‍රමිකයෙන් (ප්‍රධාන සේවා යෝජකයා හැර) බදු අඩු කළ යුතු අනුප්‍රමාණයන් පහත පරිදි වේ.

- මාසික පාරිශ්‍රමිකය රු.25,000 ට වඩා අඩු අවස්ථාවන්හිදී 10%; සහ
- මාසික පාරිශ්‍රමිකය රු.25,000 ට නොඅඩු අවස්ථාවන්හිදී 16%.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

උපයන විට ගෙවීම් අංශය - දුරකථන : 011-2302249, 011-2302246, 011-3009429
ලේකම් අංශය - දුරකථන : 011-2338635, 011-2338570

### ආදායම් කොමසාරිස් ජනරාල්

*බදු - වඩා හොඳ අනාගතයකට*